සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

61 | S | I

# දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

# Second Term Test - Grade 10 - 2019

**නම / විභාග අංකය : ............................................ භූගෝල විද්‍යාව - I** කාලය : පැය 03යි.

වැදගත් :

✳ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40කින් සමන්විත ය.

✳ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

✳ **අංක 01 සිට 10 තෙක් ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

(01) පෘථිවි ගෝලීය ජල ව්‍යාප්තියට අනුව ගොඩබිම ඇති ............................................ ජලය වැඩි ප්‍රමාණයක් අයිස්තට්ටු හා ග්ලැෂියර් ලෙස පවතී. (කරදිය / මිරිදිය /කිවුල් දිය)

(02) ජීවීන්ගේ වාස භූමිය වන්නේ ............................................ යි.
( ශිලාගෝලය / ජෛවගෝලය / වායුගෝලය)

(03) වාෂ්පීකරණය මගින් වායුගෝලයට එක් වූ ජලය නැවත ............................................ ලෙස පොළොවට පතිත වේ. (හිම / වැස්ස / වර්ෂණය)

(04) මුදුන් කිහිපයක් සහිත ඉහළ උන්නතාංශයකින් යුත් එක දිගට විහිදෙන භූ රූප ............................................ නම් වේ. (කඳු වැටි / සානු / කන්ද)

(05) ටිටිකාකා විල ............................................ මහාද්වීපය තුළ පිහිටා ඇත.
(උතුරු ඇමරිකා / දකුණු ඇමරිකා / අප්‍රිකා )

(06) ලෝක ජනගහණයෙන් බහුතරයක් ............................................ ප්‍රධාන ආහාරය ලෙස භාවිතා කරයි.
(සහල් / ඉරිඟු / තිරිඟු)

(07) ආසියාවේ වී වගා කරන ප්‍රධාන රටක් වන ............................................ අග්නිදිග ආසියා කලාපයට අයත් වේ. (තායිලන්තය / චීනය / බංග්ලාදේශය)

(08) ලෝකයේ ............................................ කලාපීය ප්‍රදේශවල කිරි පට්ටි පාලනය වැඩි වශයෙන් ව්‍යාප්තව ඇත.
(නිවර්තන / සෞම්‍ය / ශීත)

(09) ශ්‍රී ලංකාවේ මුළු වගා බිම් ප්‍රමාණයෙන් 28% පමණ ............................................ වගාවට යොදා ගෙන ඇත.
(වී / තේ/ පොල්)

(10) බිම් ඒකකයකින් ලබා ගන්නා අස්වැන්න අඩු වීම ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තයේ ............................................ ආශ්‍රිත ගැටළුවකි. (නිෂ්පාදනය / වෙළඳාම / භූමි පරිභෝගය)

✳ **අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් 'නි' යන්න වටා ද වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.**

(11) පෘථිවි තලයේ සිට 5 - 6 km පමණ දක්වා වන කලාපය තුළ මුළු වායු පරිමාවෙන් 50%ක් පමණ අන්තර්ගත ය. නි / වැ

(12) හිමාල කඳුවැටියේ පිහිටි උසම කඳු මුදුන 'එවරස්ට්' නමින් හඳුන්වයි. නි / වැ

(13) ජපන් ජාතිකයන් විසින් සොයා ගත් තේ වර්තමානය වන විට ලොව සෑම රටකම පාහේ බහුලව භාවිත කරන පානයක් ලෙස හඳුන්වා දිය හැකි ය. නි / වැ

(14) ශ්‍රී ලංකාවේ වැඩිම මත්ස්‍ය නිෂ්පාදනයක් ලබාගන්නේ වෙරළාසන්න කලාපයෙනි. නි / වැ

(15) සුවිශේෂී කරුණක් දක්වීම සඳහා පමණක් නිර්මාණය කර ඇති සිතියම් භූ ලක්ෂණ සිතියම් නම් වේ. නි / වැ

✳ **අංක 16 සිට 25 තෙක් ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

(16) මහද්වීපික කබොල .................................. පාෂාණවලින් සමන්විත වේ.

(17) දීර්ඝ කාලයක් තුළ පවත්නා වායුගෝලීය සාමාන්‍ය තත්ත්වය ........................................... නම් වේ.

(18) කබොක් මිශ්‍ර රතු පස වඩාත් යෝග්‍ය වන්නේ ................................ වගාව සඳහා ය.

(19) බෑවුම් සහිත ප්‍රදේශවල වී ගොවිතැන ........................... ක්‍රමයට සිදු කෙරේ.

(20) ශ්‍රී ලංකාවේ රබර් පර්යේෂණ ආයතනය ............................................................................. ප්‍රදේශයේ පිහිටා ඇත.

(21) හවායි දූපත් නිර්මාණය වී ඇත්තේ ගැඹුරු සාගරයේ ........................... ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයක් ලෙස ය.

✳ **ප්‍රශ්න අංක 22 සිට 25 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති වගුව උපයෝගී කර ගන්න.**

**වී වගා කරන භූමි ප්‍රමාණය හා නිෂ්පාදන ප්‍රමාණය**

| වර්ෂය | වගා කරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර දහස් | නිෂ්පාදන ප්‍රමාණය මෙට්‍රික් ටොන් දහස් |
|---|---|---|
| 2008 | 1053 | 3875 |
| 2009 | 978 | 3652 |
| 2010 | 1065 | 4301 |
| 2011 | 1223 | 3894 |
| 2012 | 1067 | 3846 |

(22) වැඩිම වී නිෂ්පාදන ප්‍රමාණය වාර්තා වන්නේ ................................... වර්ෂයේ දී ය.

(23) වැඩිම බිම් ප්‍රමාණයක වී වගා කර ඇත්තේ ................................... වර්ෂයේ දී ය.

(24) අඩුම බිම් ප්‍රමාණයක වී වගා කර ඇත්තේ ................................... වර්ෂයේ දී ය.

(25) අඩුම වී නිෂ්පාදන ප්‍රමාණය වාර්තා වන්නේ ................................... වර්ෂයේ දී ය.

✳ **අංක 26 සිට 30 තෙක් ප්‍රශ්නවල 'අ' සහ 'ආ' යනුවෙන් තීරු දෙකක් දැක්වේ. ඒවා සම්බන්ධතාවය අනුව ගැළපූ විට නිවැරදි පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියන්න.**

(26) ජෛවගෝලයේ සීමාවන් 'අ' තීරුවේ ද ඊට අදාළ උප පද්ධති 'ආ' තීරුවේ ද දැක්වේ. 'අ' තීරුවේ අනුපිළිවෙළට 'ආ' තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

'අ'
1. ශාකවල මුල් විහිදෙන කොටස
2. ප්‍රභාසංශ්ලේෂණයට හිරු එළිය ලැබෙන සාගර පතුල් සීමාව
3. පක්ෂීන් පියාසර කරන සීමාව

'ආ'
A. ජලගෝලය
B. වායුගෝලය
C. ශිලාගෝලය
D. ජෛවගෝලය

(1) C, A, D (2) A, C, D (3) C, B, D (4) C, A, B (............)

(27) ලෝකයේ ප්‍රධාන සානු කිහිපයක නම් 'අ' තීරුවේ ද ඒවා පිහිටා ඇති මහාද්වීප 'ආ' තීරුවේ ද දැක්වේ. 'අ' තීරුවේ අනුපිළිවෙළට 'ආ' තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

'අ'
1. ටිබෙට් සානුව
2. බියෙ සානුව
3. මෙක්සිකෝ සානුව

'ආ'
A. යුරෝපා මහාද්වීපය
B. ආසියා මහාද්වීපය
C. අප්‍රිකා මහාද්වීපය
D. උතුරු ඇමරිකා මහාද්වීපය

(1) A, B, D (2) B, A, C (3) B, C, D (4) C, A, B (...........)

(28) ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික බෝග තුනක් 'අ' තීරුවේ ද ඒ සඳහා අවශ්‍ය වන වර්ෂාපතන ප්‍රමාණයන් 'ආ' තීරුවේ ද දක්වේ. 'අ' තීරුවේ අනුපිළිවෙළට 'ආ' තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. වී | A. 300mm - 500mm |
| 2. තිරිඟු | B. 1900mm - 5460mm |
| 3. තේ | C. 2000mm - 2500mm |
| | D. 2000mm පමණ |

(1) D, A, B (2) C, A, B (3) D, C, B (4) A, D, B (............)

(29) ප්‍රධාන මුහුදු වර්ග තුන 'අ' තීරුවේ ද ඒ සඳහා උදාහරණ කිහිපයක් 'ආ' තීරුවේ ද දක්වේ. 'අ' තීරුවේ අනුළිවෙලට 'ආ' තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. සම්පූර්ණයෙන්ම ගොඩබිමින් වට වූ මුහුදු | A. එරල් මුහුද |
| 2. අර්ධ වශයෙන් ගොඩබිම්වලින් වට වූ මුහුදු | B. කහ මුහුද |
| 3. සාගරයට සම්බන්ධව සාගරයේම පිහිටි මුහුදු | C. රතු මුහුද |
| | D. අරාබි මුහුද |

(1) B, C, D (2) A, C, D (3) C, A, D (4) D, C, B (............)

(30) ශ්‍රී ලංකාවේ වී වගා කරන ප්‍රධාන කලාප තුනක් 'අ' තීරුවේ ද එම කලාපවලට අයත් දිස්ත්‍රික්ක 'ආ' තීරුවේ ද දක්වේ. 'අ තීරුවේ අනුපිළිවෙලට 'ආ' තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. වියළි කලාපය | A. ගාල්ල |
| 2. අතරමැදි කලාපය | B. අනුරාධපුරය |
| 3. තෙත් කලාපය | C. කුරුණෑගල |
| | D. මාතලේ |

(1) C, A, D (2) A, C, D (3) B, C, A (4) B, D, A (............)

✳ **අංක 31 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

(31) ජෛවගෝලයේ ක්‍රියාකාරීත්වයට බලපාන අජීවී සාධකයක් වන්නේ මින් කුමක් ද?

(1) ශාක (2) ජලය

(3) සතුන් (4) වියෝජකයින් (............)

(32) ලෝකයේ විශාලම මිරිදිය විල වන්නේ මින් කුමක් ද?

(1) බයිකල් විල (2) සුපීරියර් විල

(3) වික්ටෝරියා විල (4) ඔනීගා විල (............)

(33) වී වගාව සඳහා අවශ්‍ය භෞතික සාධකයක් වන්නේ මින් කුමක් ද?

(1) ශ්‍රමය (2) මද බෑවුම් සහිත බිම්

(3) දියළු පස (4) $15^0C$- $27^0C$ අතර උෂ්ණත්වය (............)

(34) ශ්‍රී ලංකාව අපනයනය කරන සාම්ප්‍රදායික නොවන සුළු අපනයන බෝග අඩංගු පිළිතුර තෝරන්න.

(1) කුරුඳු, ගම්මිරිස් (2) බුලත්, කෝකෝවා

(3) කෝපි, එනසාල් (4) එළවළු, පලතුරු (............)

(35) ආසියාවෙන් බැහැර වී වගා කරන ප්‍රදේශයක් වන පෝ ගංගා නිම්නය පිහිටා ඇති රට මින් කුමක් ද?

(1) ප්‍රංශය | (2) ජර්මනිය
(3) ග්‍රීසිය | (4) ඉතාලිය (............)

(36) පෘථිවි ව්‍යුහය හා සම්බන්ධ පහත ප්‍රකාශ අතරින් **වැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) පෘථිවි කබොල සියල් හා සිමැග් යන ස්තර දෙකෙන් සමන්විත වේ.
(2) ප්‍රවාරණයේ පහළ කොටසේ පාෂාණ ද්‍රව ස්වරූපයෙන් පවතී.
(3) කබොල හා ප්‍රාවරණය වෙන් කෙරෙන සීමාව ගුටෙන්බර්ග් අසන්තතිය නමින් හැඳින්වේ.
(4) පෘථිවි හරය, ප්‍රාවරණයට වඩා ඝනත්වයෙන් වැඩි ය. (............)

(37) පෘථිවියේ භෞතික ලක්ෂණ හා සම්බන්ධ පහත ප්‍රකාශ අතරින් **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) සාගර ජලයෙන් ඉහළට නැගුණු විශාල භූමි ස්කන්ධ මහාද්වීප නම් වේ.
(2) මහාද්විපික මායිමේ සිට සාගරය දෙසට විහිදුන නොගැඹුරු මුහුදු තීරය මහාද්වීපික බෑවුම නම් වේ.
(3) කඳුකර ප්‍රදේශයක පිහිටි උස් සම භූමි ප්‍රදේශ පළිහ නම් වේ.
(4) ගොඩබිම පිහිටි ජලය පිරි ආවාට මුහුදු නම් වේ. (............)

✳ **අංක 38 සිට 39 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන තොරතුරු උපයෝගී කර ගන්න.**

A - අස්වැන්න
B - කෘමිනාශක භාවිතය
C - යෙදවුම්වල මිල
D - ජෛව විවිධත්වය
E - පොහොර භාවිතය

(38) ඉහත එක් සාධකයක වැඩි වීම තවත් සාධකයක වැඩි වීම කෙරෙහි බලපෑමක් ඇති කරන බවට දැක්වෙන ප්‍රකාශ අඩංගු අක්ෂර දෙක ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) C හා A ය. (2) E හා A ය. (3) B හා D ය. (4) A හා B ය. (............)

(39) ඉහත එක් සාධකයක වැඩි වීම තවත් සාධකයක අඩු වීම කෙරහි බලපෑමක් ඇති කරන බවට දැක්වෙන ප්‍රකාශ අඩංගු අක්ෂර දෙක ඇතුළත් පිළිතුර වනුයේ,

(1) A හා C ය. (2) E හා C ය. (3) B හා D ය. (4) D හා A ය. (............)

(40) භූ ලක්ෂණ සිතියම්වල දැක්වෙන පහත තොරතුරු අතරින් භෞතික ලක්ෂණයක් අඩංගු පිළිතුර තෝරන්න.

(1) වැව, ගංගාව, වාරි මාර්ග ඇළ | (2) වී වගාව, හේන, ගෙවතු
(3) පාසල, රෝහල, පොලීසිය | (4) අඩිපාර, කරත්ත පාර, අභයභූමි මායිම් (............)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Provincial Department of Education - NWP**

61 S II

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

## Second Term Test - Grade 10 - 2019

**නම / විභාග අංකය :** ............................................ **භූගෝල විද්‍යාව - II**

වැදගත් :

✳ මෙම ප්‍රශ්න පත්‍රය I, II වශයෙන් කොටස් දෙකකින් සමන්විත ය.
✳ I කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් තුනට ම පිළිතුරු සැපයිය යුතු ය.
✳ II කොටසින් ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
✳ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.


### I කොටස

(01) (අ) ඔබ අධ්‍යයනය කොට ඇති 1 : 50 000 භූ ලක්ෂණ සිතියම් පිළිබඳ දැනුම භාවිත කොට පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ශ්‍රී ලංකාවේ භාවිත වන 1 : 50 000 පරිමාණයේ භූ ලක්ෂණ සිතියමක දිග හා පළල සෙන්ටිමීටර් වලින් දක්වන්න. (ලකුණු 01)

(ii) භූ ලක්ෂණ සිතියම්වල කිසියම් ස්ථානයක පිහිටීම දැක්විය හැකි ආකාරයක් නම් කරන්න. (ලකුණු 01)

(iii) භූ ලක්ෂණ සිතියම්වල දිශාව දක්වන සටහනක් පහත වේ. එහි A හා B වලින් දිශාව පෙන්නුම් කරන ආකාරයන් නම් කරන්න.





(ලකුණු 02)

(iv) භූ ලක්ෂණ සිතියම්වල පහත සඳහන් සංස්කෘතික ලක්ෂණ පෙන්නුම් කිරීමට යොදා ගන්නා සම්මත සංකේත නියමිත හැඩයෙන් හා වර්ණයෙන් ඇඳ දක්වන්න.

(a) ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාස මායිම


(b) රෝහල (ලකුණු 02)

(v) පහත සිතියම් ප්‍රදේශයෙහි වර්ගඵලය වර්ග කිලෝමීටරවලින් දක්වන්න.




(ලකුණු 02)

(vi) පහත සඳහන් A හා B චතුරස්‍රවල ඇති A- A රේඛා මත දැක්වෙන භූ විෂමතා ලක්ෂණ නම් කරන්න.




A B

(ලකුණු 02)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) සිතියමෙහි ලකුණු කොට ඇති A, B හා C අක්ෂරවලින් තස්මේනියා දූපත දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) සිතියමෙහි ලකුණු කොට ඇති D, E හා F අක්ෂරවලින් වොල්ගා ගඟ දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iii) සිතියමෙහි ලකුණු කොට ඇති G, H හා J අක්ෂරවලින් රොකී කඳු වැටිය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iv) සිතියමෙහි ලකුණු කොට ඇති K, L හා M අක්ෂරවලින් මැන්චූරියා තැන්න දැක්වෙන අක්ෂරය කුමක් ද?

(v) සිතියමෙහි ලකුණු කොට ඇති P, Q හා R අක්ෂරවලින් තේ නිෂ්පාදනයට වැදගත් අප්‍රිකානු රටක් වන කෙන්යාව දැක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 05)

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) සිතියමෙහි ලකුණු කොට ඇති A, B හා C අක්ෂරවලින් කැලණි ගඟ දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) සිතියමෙහි ලකුණු කොට ඇති D, E හා F අක්ෂරවලින් කුදිරමලේ තුඩුව දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iii) සිතියමෙහි ලකුණු කොට ඇති G, H හා J අක්ෂරවලින් මිරිදිය මසුන් බෝකිරීමේ මධ්‍යස්ථානයක් වන දඹුල්ල දැක්වෙන අක්ෂරය කුමක් ද?


(iv) සිතියමෙහි ලකුණු කොට ඇති K, L හා M අක්ෂරවලින් වී පර්යේෂණ ආයතනයක් පිහිටි අම්බලන්තොට දැක්වෙන අක්ෂරය කුමක් ද?

(v) සිතියමෙහි ලකුණු කොට ඇති P, Q හා R අක්ෂරවලින් කෑගල්ල දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ලකුණු 05)

## II කොටස

(02) යාබද රූප සටහනින් දැක්වෙන්නේ පෘථිවි ජල ගෝලයේ ව්‍යාප්තියයි.




(i) B හා C වලින් දැක්වෙන ජල ව්‍යාප්ති අවස්ථා දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) (a) A වලින් දැක්වෙන ජල ව්‍යාප්ති අවස්ථාව කුමක් ද?


(b) ඉහත A වලින් දැක්වෙන අවස්ථාවේ පවතින ජලයෙන් ලබා ගන්නා ප්‍රයෝජන දෙකක් ලියන්න.

(ලකුණු 03)

(iii) (a) ජලයේ ගුණාත්මකභාවය අඩුවීම සඳහා බලපාන මිනිස් ක්‍රියාකාරකම් දෙකක් ලියන්න.

(b) ජල නාස්තිය හා ජලයේ ගුණාත්මක බව අඩුවීම නිසා අනාගතයේ ඇතිවිය හැකි ජල හිගය මගහරවා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03) පෘථිවි ව්‍යුහයේ ස්තර දැක්වෙන හරස්කඩක් යාබද රූපයෙන් දක්වා ඇත.





(i) A හා B වලින් දැක්වෙන සීමාවන් දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) අංක 1, 4 හා 5න් දැක්වෙන පෘථිවි ව්‍යුහයේ ස්තර පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 03)

(iii) (a) අංක 2 හා 3න් දැක්වෙන ස්තර පිළිවෙළින් නම් කරන්න.

(b) ඉහත ඔබ නම් කළ ස්තර දෙකෙහි විශේෂ ලක්ෂණ පිළිබඳ වාක්‍ය තුනක් ලියන්න. (ලකුණු 05)

(04) (i) මහාද්වීපික මායිමේ පිහිටීම දැක්වෙන යාබද රූපයේ A හා B වලින් දැක්වෙන ප්‍රදේශ නම් කරන්න. (ලකුණු 02)




(ii) පහත සඳහන් මහද්වීපික තටකයන් තුළ පිහිටි දූපත බැගින් නම් කරන්න.


(a) ආසියා

(b) අප්‍රිකා

(c) ඕස්ට්‍රේලියා (ලකුණු 03)

(iii) ඉහත රූප සටහනේ A වලින් දැක්වෙන ප්‍රදේශය ප්‍රයෝජනයට ගන්නා ආකාර තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

✳ **ප්‍රශ්න අංක 5 සහ 6 සඳහා පහත දී ඇති ලෝක සිතියම උපයෝගී කර ගන්න.**




(5) (i) සිතියමේ A හා B අක්ෂරවලින් දැක්වෙන තිරිඟු වගා කරන රටවල් දෙක පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02)

(ii) (a) C අක්ෂරයෙන් දැක්වෙන ආසියාවේ වී වගා කරන රට ද,

(b) D අක්ෂරයෙන් දැක්වෙන ආසියාවෙන් බැහැර වී වගා කරන ප්‍රදේශය ද නම් කරන්න.

(c) වී හා තිරිඟු නිෂ්පාදනය ආශ්‍රිත දැකිය හැකි සමාන ලක්ෂණයක් ලියන්න. (ලකුණු 03)

(iii) (a) ලෝකයේ වී වගාව ව්‍යාප්ත වීම කෙරෙහි බලපාන භෞතික සාධක දෙකක් ලියන්න.

(b) ලෝකයේ වී වගාව ආශ්‍රිත විශේෂ ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06) (i) ලෝකයේ යකඩ හා වානේ කර්මාන්තය සිදු කරන,

(a) E අක්ෂරයෙන් දැක්වෙන ආසියාතික රට ද


(b) F අක්ෂරයෙන් දැක්වෙන උතුරු ඇමරිකාවට අයත් රට ද නම් කරන්න. (ලකුණු 02)

(ii) කර්මාන්ත ස්ථානගත වීමට බලපාන සාධක තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) (a) යකඩ හා වානේ නිෂ්පාදන යොදා ගන්නා ක්ෂේත්‍ර දෙකක් නම් කරන්න.

(b) යකඩ හා වානේ කර්මාන්තයේ ප්‍රවණතා දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

✳ **ප්‍රශ්න අංක 7 සහ 8 සඳහා පහත දී ඇති ශ්‍රී ලංකා සිතියම උපයෝගී කර ගන්න.**




(07) (i) A අක්ෂරයෙන් දැක්වෙන රබර් වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්කය ද B අක්ෂරයෙන් දැක්වෙන අලුතෙන් රබර් වගාව ආරම්භ කළ දිස්ත්‍රික්කය ද නම් කරන්න. (ලකුණු 02)

(ii) (a) උඩරට තේ වගාව සිදු කරන නුවරඑළිය දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(b) C අක්ෂරයෙන් දැක්වෙන මැද රට තේ වගා කරන දිස්ත්‍රික්කය කුමක් ද?

(c) ශ්‍රී ලංකාවේ තේ වගාව වැඩි දියුණු කිරීම උදෙසා පිහිටුවා ඇති ආයතනයක් නම් කරන්න. (ලකුණු 03)

(iii) (a) ශ්‍රී ලංකාවෙන් තේ මිලදී ගන්නා රටක් නම් කරන්න.

(b) තේ වගාව වැඩි දියුණු කිරීමෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ලබා ගත හැකි ප්‍රයෝජන 2ක් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(08) ඉහත සිතියමේ

(i) (a) ගාල්ල ධීවර වරාය දැක්වෙන අක්ෂරය ද

(b) කරදිය මසුන් බෝ කරන මධ්‍යස්ථානයක් වන පිටිපන දැක්වෙන අක්ෂරය ද නම් කරන්න.

(ලකුණු 02)

(ii) (a) කරදිය ධීවර කර්මාන්තයේ ප්‍රධාන අංශ දෙක නම් කරන්න.


(b) වර්තමානයේ වැව් හා ජලාශවල බෝ කරනු ලබන මත්ස්‍ය වර්ගයක් නම් කරන්න. (ලකුණු 03)

(iii) (a) ශ්‍රී ලංකාව තුළ පවතින, ධීවර කර්මාන්තය සඳහා හිතකර සාධක දෙකක් නම් කරන්න.

(b) ශ්‍රී ලංකා ආර්ථිකයට ධීවර කර්මාන්තයෙහි ඇති වැදගත්කම පිළිබඳ කරුණු දෙකක් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ආ) / (ஆ) / (b)




(i) ☐


(ii) ☐

(iii) ☐

(iv) ☐

(v) ☐

(ඉ) / (இ) / (c)




(i) ☐

(ii) ☐

(iii) ☐

(iv) ☐

(v) ☐

(1) (අ) அ (a) ___/10 (ආ) (ஆ) (b) ___/5 (ඉ) (இ) (c) ___/5 = ___/20